සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/3/ACC/ 14 ම.ඛ.ඡ.-2016

ඔබේ අංකය / உமது இல / Your No: ……………………

දිනය / திகதி / Date: 2016.06.20

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**නව සේවකයින් ලෙස දෙපාර්තමේන්ත්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරින් සඳහා පාරිතෝෂික දීමනා ගෙවීම**

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේදී නව සේවකයින් ලෙස දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරින් සඳහා පාරිතෝෂික පනතේ විධිවිධාන පරිදි ගෙවිය යුතු පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා රු. බිලි. 5.2 ක මුදලක් ලබාදීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතකර ඇත.

ඒ යටතේ 2016 වර්ෂයේදී රු. මිලි. 1000 ක් ද 2017 වර්ෂයේදී රු. මිලි. 4200 ක මුදලක්ද ලබාදීමට භාණ්ඩාගාරය එකඟතාවය පළකර ඇත. 2016 වර්ෂයේදී ලබාදීමට නියමිත රු. මිලි. 1000 න් මිලි. 500 ක් ලබාදුන් අතර එම මුදල සියළුම සේවකයන් සඳහා පාරිතෝෂික දීමනා ගෙවීමට ප්‍රමාණවත් නොවන හෙයින් තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක් සඳහා සම්පූර්ණ පාරිතෝෂික මුදල් ද ඇතැම් දිස්ත්‍රික්ක කිහිපයක් සඳහා අර්ධ වශයෙන් ද පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා මුදල් වෙන් කරදෙන ලදි.

භාණ්ඩාගාරය විසින් මුදල් නිදහස්කරන ආකාරය අනුව ඉදිරියේදී ඉතිරි දිස්ත්‍රික්ක සඳහා මුදල් නිදහස් කිරීමට කටයුතු සූදානම් කර ඇති බව දන්වමි. පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් 331-2-2-0-1502 වැය විෂය යටතේ මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇති අතර අදාල වියදම් දැරීම සඳහා මුදල් රෙගුලාසි 135 යටතේ පහත සඳහන් පරිදි බලය පවරමි.

වැය විෂය - 331-2-2-0-1502

| කාර්යය | ප්‍රධාන කාර්යාලය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|
| වියදම් සඳහා බලය දීම | අධ්‍යක්ෂ ජනරාල් / අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / අධ්‍යක්ෂ (පාලන) | දිස්ත්‍රික් ලේකම් (දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්) | ප්‍රාදේශීය ලේකම් |
| අනුමත කිරීම | අධ්‍යක්ෂ ජනරාල් / අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / අධ්‍යක්ෂ (පාලන) | දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | ප්‍රාදේශීය ලේකම් / සහකාර ප්‍රාදේශීය ලේකම් |

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | 011- 2887722(Hotline) |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

| | | | |
|---|---|---|---|
| සහතික කිරීම | ප්‍රධාන ගණකාධිකාරී/ ගණකාධිකාරි (වත්කම් සහ සහනාධාර) / ගණකාධිකාරි (වැටුප් සහ ගෙවීම්) | දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ගණකාධිකාරි හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි |
| ගෙවීම | ප්‍රධාන ගණකාධිකාරී/ ගණකාධිකාරි (වත්කම් සහ සහනාධාර) / ගණකාධිකාරි (වැටුප් සහ ගෙවීම්) | දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ගණකාධිකාරි හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි |

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

01. ලේකම් - සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.පි.

02. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.පි.

03. අයි.ආර්.එස්.කේ. ජයතිලක මිය - දැ.ගැ.පි. සහ අ.ක.ස